# ආර්ථික විද්‍යාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 08. සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීමෙහිලා රජය මැදිහත් වන ආකාරය

## බහුවරණ ප්‍රශ්න

අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර** තෝරන්න.

1. ශුද්ධ පොදු භාණ්ඩයක් යන්නට ඇතුළත් කළ හැක්කේ,
   (1) අධ්‍යාපනය
   (2) ජාතික ආරක්ෂාව
   (3) භාණ්ඩ ප්‍රවාහනය
   (4) සෞඛ්‍යය
   (5) නොමිලේ ලබා දෙන පාසල් පෙළ පොත් වේ.

2. සුභසාධක භාණ්ඩ යන්නට ඇතුළත් වන්නේ,
   (1) නිෂ්පාදනයෙහි බාහිර පිරිවැයක් නොමැති භාණ්ඩ වේ.
   (2) වෙළෙඳපොල මඟින් සැපයිය නොහැකි භාණ්ඩ වේ.
   (3) වෙළෙඳපොල මඟින් පමණක් සැපයිය හැකි භාණ්ඩ වේ.
   (4) හිමිකරගන්නා පුද්ගලයාට මෙන්ම සමාජයටත් ප්‍රතිලාභ ලබා දෙන භාණ්ඩ වේ.
   (5) පරිභෝජනයේ දී සමාජ ප්‍රතිලාභවලට වඩා පෞද්ගලික ප්‍රතිලාභ ලබා දෙන භාණ්ඩ වේ.

3. අනුක්‍රමික ආදායම් බද්දක දී අඩු ආදායම් ලාභීන්,
   (1) ඉහළ ආදායම්ලාභීන්ට වඩා වැඩි බදු ප්‍රතිශතයක් ගෙවයි.
   (2) ඉහළ ආදායම්ලාභීන්ට වඩා අඩු බදු ප්‍රතිශතයක් ගෙවයි.
   (3) ඉහළ ආදායම්ලාභීන්ට වඩා අඩු රුපියල් ප්‍රමාණයක් ගෙවයි.
   (4) ඉහළ ආදායම්ලාභීන්ට වඩා වැඩි රුපියල් ප්‍රමාණයක් ගෙවයි.
   (5) ඉහළ ආදායම් ලාභින් මෙන්ම පහළ ආදායම්ලාභින්ද වැඩි රුපියල් ප්‍රමාණයක් ගෙවයි.

4. ශුද්ධ පොදු භාණ්ඩයක් අමතර පාරිභෝගිකයෙකු වෙත යැවීමේදී ආන්තික පිරිවැය,
   (1) ඍණ අගයක් වේ.
   (2) ධන අගයක් ගනී.
   (3) එකට වැඩි ධන අගයක් ගනී.
   (4) ශූන්‍යවේ.
   (5) ස්ථිරව ප්‍රකාශ කළ නොහැක.

5. වෙළෙඳපොල අසමත්වීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතුවකි.
   (1) පොදු භාණ්ඩ අවභාවිතය
   (2) සාර්ව ආර්ථික අස්ථායිතාව
   (3) අසම්පූර්ණ තොරතුරු
   (4) බාහිරතා සැලකිල්ලට නොගැනීම.
   (5) සමාජයට අහිතකර භාණ්ඩ සැපයීම.



වාණිජ්‍ය අධ්‍යයන සොබා

6. කිසියම් භාණ්ඩයක් අතිරේක පුද්ගලයෙකු භාවිතයට ගැනීම හේතුවෙන් ආන්තික ආවස්ථික පිරිවැය ශුන්‍ය අගයක් විය. එම භාණ්ඩය
   (1) අර්ධ පොදු භාණ්ඩයකි.
   (2) ශුද්ධ පොදු භාණ්ඩයකි.
   (3) නීච භාණ්ඩයකි.
   (4) අවගුණ භාණ්ඩයකි.
   (5) සාමාන්‍ය භාණ්ඩයකි.

7. ප්‍රතික්‍රම ආදායම් බද්දකදී දැකිය හැක්කේ,
   (1) ආදායමට සමානව සෑම කෙනෙකුම බදු ගෙවන බවයි.
   (2) බදු පදනම අනුව සමානව බදු ගෙවන බවයි.
   (3) බදු පදනම වැඩි විමත් සමඟ ගෙවන බදු ප්‍රතිශතය අඩු වන බවයි.
   (4) බදු පදනම වැඩි වීමත් සමඟ ගෙවන බදු ප්‍රතිශතය ද වැඩි වන බවයි.
   (5) බදු පදනම මත බදු අය නොකරන බවයි.

8. බදු අය කිරීමේ මූලධර්මයක් නොවන්නේ,
   (1) සාධාරණත්වය
   (2) නම්‍යශීලී බව
   (3) සරල බව
   (4) පිරිමැසුම් බව
   (5) සංකීර්ණ බව

9. තෙරපුම් ප්‍රතිවිපාකයෙන් විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවරෙක් ද ?

(I). අයවැය හිඟය මූල්‍යනය සඳහා ණය ලබාගන්නා විට රජය පෞද්ගලික ණය ගනුවන් සමග තරඟ කිරීමේ දී පොලී අනුපාතිකයන් ඉහළ යාම හේතුවෙන් පෞද්ගලික ආයෝජන පහළ වැටේ.


(II). පෞද්ගලික ණය ගනුවන් මුදල් ණයට ගන්නා විට රජය සමඟ තරඟ කරන අතර ඒහි දී පොලි අනුපාතික පහළ වැටීම නිසා පෞද්ගලික ආයෝජන ඉහළ නගී.

(III). ව්‍යාපාරික ආයතන ආයෝජන ව්‍යාපෘති සඳහා තරඟ කරන විට ඉතා ප්‍රබල සමාගම් තරගයේ තෙරපුමට ලක්වීමෙන් ව්‍යාපාරික බිඳවැටීම් හට ගනී .

(IV) රජය මුදල් වෙළඳපොළෙන් බැඳුම් කර නැවත මිලට ගන්නා විට මුදල් සැපයුම අඩුවන අතර පෞද්ගලික ආයෝජකයන්ට ණය ලබාගැනීම සඳහා තරඟ කිරීමට සිදුවේ.

(V) රජය පොලී අනුපාතිකය ඉහළ නොදමා මුදල් මුදල් සැපයුම වැඩි කරන විට උද්ධමන අනුපාතිකය සහ පෞද්ගලික ආයෝජන වැඩි වේ.

10. පහත රූප සටහනේ දැක්වෙන්නේ පෞද්ගලික පිරිවැය ඉක්මවා සමාජ පිරිවැය පවතින අවස්ථාවකි.




මෙහි A,B,C වලින් පිළිවෙලින් නිරූපණය කෙරෙනුයේ ,

(1) ආන්තික බාහිර පිරිවැය, ආන්තික පෞද්ගලික පිරිවැය,ආන්තික සමාජ පිරිවැය
(2) ආන්තික සමාජ පිරිවැය, ආන්තික පෞද්ගලික පිරිවැය, ආන්තික බාහිර පිරිවැය
(3) ආන්තික සමාජ ප්‍රතිලාභ, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ, ආන්තික සමාජ ප්‍රතිලාභ
(4) ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ, ආන්තික බාහිර ප්‍රතිලාභ, ආන්තික සමාජ ප්‍රතිලාභ
(5) ආන්තික පෞද්ගලික පිරිවැය, ආන්තික සමාජ පිරිවැය, ආන්තික පිරිවැය

11. අයවැය හිඟයක ආර්ථික ප්‍රතිවිපාකයක් වන්නේ
(1) උද්ධමනාත්මක බලපෑම් ඇති වීමයි
(2) දල දේශීය ඉතුරුම් ඉහළ යාමයි.
(3) සාර්ථක අයවැය දර්ශකයක් වීමයි.
(4) රාජ්‍ය ආයෝජන ඉහළ නංවා ගැනීමයි.
(5) පොළී පිරිවැය පහළ යාමයි.

12. වර්තන වියදම් හා රාජ්‍ය ණය ආපසු ගෙවීම් වාරික ඇතුලත් නොවූ ප්‍රාග්ධන වියදම් වල එකතුවත් රජයේ මුළු ආදායමත් අතර වෙනස වන්නේ
(1) අයවැය ලේඛණයේ සමස්ත හිඟයයි
(2) අයවැය ලේඛණයේ ශුද්ධ මූල්‍ය හිඟයයි
(3) අයවැය ලේඛණයේ ප්‍රාථමික ගිණුමේ හිඟයයි
(4) අයවැය ලේඛණයේ වර්තන ගිණුමේ හිඟයයි
(5) අයවැය ලේඛණයේ වර්තන හා ප්‍රාග්ධන ගිණුම්වල හිඟයයි

13. ශ්‍රී ලංකාවේ 2021 වර්ෂයේ රාජ්‍ය ආදායමින් ණය ආපසු ගෙවීම් සඳහා වැය කල ප්‍රතිශතය වන්නේ
(1) 141%
(2) 163%
(3) 101%
(4) 104%
(5) 128%

14. ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුල්කාරත්ව ව්‍යාපෘතියක් නොවන්නේ, මින් කවරක්ද?

(1) ලාෆ් එල්. පී. ගෑස් පර්යන්තය
(2) කොළඹ දකුණු බහලුම් පර්යන්තය
(3) නොරොච්චෝල ගල් අඟුරු බලාගාරය
(4) කැළණිතිස්ස බලාගාරය ආශ්‍රිත බලාගාර ව්‍යාපෘති
(5) කොළඹ - මාතර මහා මාර්ග

15. කල්පිත ආර්ථිකයක අයවැය ලේඛනයට අදාල පහත තොරතුරු සපයා ඇත.

| | රු.මි. | | රු.මි |
|---|---|---|---|
| බදු ආදායම | 200 | භාණ්ඩ හා සේවා මිලදී ගැනීම | 110 |
| බදු නොවන ආදායම | 50 | වැටුප් හා වේතන ගෙවීම් | 80 |
| විදේශ ප්‍රදාන ලැබීම් | 60 | වෙනත් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් | 30 |
| පොලී ගෙවීම් | 90 | වර්තන පැවරුම් හා සහනාධාර | 70 |

ඉහත තොරතුරු අනුව වර්තන ගිණුමේ ශේෂය වන්නේ, කුමක්ද?
(1) 80
(2) -20
(3) 20
(4) -110
(5) -30

16. රජයේ පාලනයකින් තොරව කිසියම් අවගුණ භාණ්ඩයක් වෙළෙඳපල විසින් සපයනු ලබන්නේ යැයි සලකන්න. ප්‍රශස්ත සම්පත් බෙදී යාමේ තත්වය යටතේ එම නිමැවුම සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් නිවැරදිවේද?

| වෙළෙඳපොල මිල | වෙළෙඳපොල ප්‍රමාණය |
|---|---|
| ඉතා පහළය. | ඉතා අඩුය. |
| ඉතා ඉහළය. | ඉතා ඉහළය. |
| ඉතා පහළය. | ඉතා ඉහළය. |
| ඉතා ඉහළය. | ඉතා අඩුය. |
| වෙනස් නොවේ. | ඉතා ඉහළය |

17. සමානුපාතික බද්දකදී,

(1) සෑම බදු ගෙවන්නෙක්ම සමාන මුදල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවනු ලබයි.
(2) ආදායම වැඩි වන විට බදු ප්‍රතිශතයද සියුම් ආකාරයෙන් ඉහළ යයි.
(3) ආදායම වැඩි වන විට බදු ප්‍රතිශතයද සියුම් ආකාරයෙන් පහළ යයි.
(4) සෑම අයෙකුගේම බදු මුදල ඔහුගේ ආදායම් අනුපාතයක් ලෙස ගත් විට සමානවේ.
(5) ආදායම ඉහළ යන විට බදු ප්‍රතිශතය පහළ යයි.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

18. බදු ආදායමේ සංවේදිතා සංගුණකය යනුවෙන් අදහස් කරනුයේ,

    (1) රටක් උපයා ගත් බදු මුදල් ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
    (2) රටක් උපයාගත් බදු මුදල් ප්‍රමාණයෙහි සිදු වූ වෙනස දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
    (3) බදු මුදල් වෙනස් වන ප්‍රමාණයත් බදු පදනම වෙනස් වන ප්‍රමාණයත් අතර අනුපාතයයි.
    (4) උපයාගත් බදු මුදල සහ බදු පදනම අතර අනුපාතයයි.
    (5) බදු ආදායම වෙනස් වන ප්‍රමාණයත් දළ දේශීය නිෂ්පාදිතය වෙනස් වන ප්‍රමාණයත් අතර අනුපාතයයි.

19. කිසියම් අමාත්‍යාංශයකට විසර්ජන පනතින් ප්‍රතිපාදනය කරන ලද මුදල් ප්‍රමාණවත් නොවන විටක ඉදිරි කෙටි කාලයේ වියදම් පියවා ගැනීමට මුදල් ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වියදම් ඇස්තමේන්තුව වන්නේ,

    (1) අතුරු සම්මත ගිණුමයි
    (2) අතුරු අයවැයයි
    (3) පරිපූරක ඇස්තමේන්තුවයි
    (4) විමධ්‍යගත අයවැයයි
    (5) වැඩසටහන් අයවැයයි

20. ආණ්ඩුවේ ගාස්තු හා අලෙවි ආදායම් වලට අදාල ආදායමක් වන්නේ,

    (1) ගමන් බල පත්‍ර ගාස්තු
    (2) සමාජ සංරක්ෂණ දායක මුදල්
    (3) කුලී ආදායම්
    (4) පොලී ආදායම්
    (5) බදු කුලී ආදායම්

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන අංශය

# ආර්ථික විද්‍යාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
## සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 08. සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීමෙහිලා රජය
## මැදිහත් වන ආකාරය
## බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1. | (2) |
| 2. | (4) |
| 3. | (2) |
| 4. | (4) |
| 5. | (2) |
| 6. | (2) |
| 7. | (3) |
| 8. | (5) |
| 9. | (1) |
| 10. | (1) |
| 11. | (1) |
| 12. | (2) |
| 13. | (2) |
| 14. | (5) |
| 15. | (2) |
| 16. | (2) |
| 17. | (4) |
| 18. | (5) |
| 19. | (3) |
| 20. | (1) |

වාණිජ්‍ය හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ආර්ථික විද්‍යාව
## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 08. සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීමෙහිලා රජය මැදිහත් වන ආකාරය
## ව්‍යුහගත ප්‍රශ්න

**සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1.

(i) අර්ධ පොදු භාණ්ඩ පොදු සම්පත් වලින් වෙනස් වන ආකාරය දක්වා ඒ එක් එක් භාණ්ඩය සඳහා නිදසුන් සපයන්න.

(ii) බදු අයකිරීමේ පදනම යනු කුමක්දැයි දක්වා බදු පදනමට යොදා ගන්නා මූලාශ්‍ර කවරේදැයි දක්වන්න.

(iii) නිෂ්පාදනයේ ධන බාහිරතා හා සෘණ බාහිරතා පවතින විට සමතුලිත නිමැවුම් මට්ටම සහ සමාජ ප්‍රශස්ත නිමැවුම් මට්ටම් අතර දක්නට ලැබෙන වෙනස්කම් කවරේදැයි රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(iv) බදු ආපාතය යන්න හඳුන්වා බදු ආපාතයෙහි කොටස් කවරේදැයි පැහැදිලි කරන්න.

(v) ආණ්ඩුවේ අයවැය ලේඛණයෙහි ශුද්ධ මූල්‍ය හිඟය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

2. පහත දැක්වෙන්නේ එක්තරා ආර්ථිකයක රාජ්‍ය අයවැය ලේඛනය හා සම්බන්ධ දත්තයන්ය.

| | |
|---|---|
| බදු ආදායම | 15,000 |
| බදු නොවන ආදායම | 10,000 |
| ප්‍රදාන | 3,000 |
| වර්තන වියදම(පොලී ගෙවීම් 4000 ඇතුළුව | 19,000 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම් | 10,000 |
| (රාජ්‍ය ආයෝජන 5,000) | |

(i)

a) වර්තන ගිණුමේ ශේෂය

b) සමස්ත ගිණුමේ ශේෂය

c) ප්‍රාථමික ගිණුමේ ශේෂය

(ii) වෙළෙඳපොල ආර්ථිකයක සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පවතින බාධක මොනවාද?

(iii) බදු ආදායම් සංවේදිතා සංගුණකය යන්නෙන් කුමක් අදහස් කරයිද?

(iv) සැපයුම් පාර්ශවීය ආර්ථික ප්‍රතිපත්ති යනුවෙන් කුමක් අදහස් කරන්නේද? සැපයුම් පාර්ශවීය ආර්ථික ප්‍රතිපත්ති උපකරණ කවරේදැයි දක්වන්න.

(v) ශ්‍රී ලංකාවේ බදු ආදායම් නොවන මූලාශ්‍ර කවරේද?

3.

(i) සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදා ගන්නා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කවරේද? පැහැදිලි කරන්න.

(ii) පහත සඳහන් ඒවා පොදු භාණ්ඩ, ගෝලීය පොදු භාණ්ඩ , පොදු සම්පත් , අර්ධ පොදු භාණ්ඩද යන්න වර්ග කර දක්වන්න.

පොලිස් සේවය
ගෝලීය මූල්‍ය ස්ථාවරත්වය
ජාතික ආරක්ෂාව
තෘණ බිම්

(iii) ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමේ කුටුම්බ පැවරුම් (සහනාධාර ) වලට ඇතුලත් සංරචකයන් කවරේද?

(iv) වෙළෙඳපොල ක්‍රමය නිවැරදි කිරීම සඳහා ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ග අසාර්ථක වීමට බලපාන හේතු කවරේද?

(v) ශ්‍රී ලංකාවේ රාජ්‍ය බදු නොවන ආදායමේ මූලාශ්‍ර කවරේද?

4.

(i) ගිග් (gig Economy) ආර්ථිකය යන්නෙන් කුමක් අදහස්වේද? ගිග් ආර්ථික කටයුතු වල නිරත වීමට හේතු සඳහන් කරන්න.

(ii) පෞද්ගලික දෘෂ්ටිකෝණයෙන් ප්‍රශස්ත නිශ්පාදනය හා සමාජයීය දෘෂ්ටිකෝණයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය තීරණය වන විට වෙළෙඳපොල ක්‍රමය දැකිය හැකි ලක්ෂණ කවරේද?

(iii) සුගුණ භාණ්ඩ හා අවගුණ භාණ්ඩ අතර වෙනස කවරේද?

(iv) ශ්‍රී ලංකා රජයේ දේශීය ණය මූලාශ්‍ර කවරේද?

(v) ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමේ ප්‍රධාන සංරචක කවරේද?

5.

(i) වෙළෙඳපොල ආර්ථිකයක් අසමත් වීමට සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වීම හේතු වෙයි. එයට බලපාන සාධක කවරේද?

(ii) බාහිරතා යන්නෙන් කුමක් අදහස්වේද? බාහිරතා ප්‍රභේද කවරේද?

(iii) පහත ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

a) පෞද්ගලික පිරිවැය
b) බාහිර පිරිවැය
c) බාහිර ප්‍රතිලාභ
d) සමාජ පිරිවැය

(iv) ශ්‍රී ලංකාවේ ආයෝජන ආකර්ෂණය ඉහළ නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද?

(v) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම් සංයුතිය කෙබඳුද?

# ආර්ථික විද්‍යාව
## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 08. සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීමෙහිලා රජය මැදිහත් වන ආකාරය
## ව්‍යුහගත ප්‍රශ්න සඳහා පිළිතුරු

1.

(i) ධාරිතා මට්ටම ළඟා වන තෙක් පාරිභෝජනයේ තරඟකාරිත්වයක් නොමැති එහෙත් පාරිභෝජනය සීමා කළ හැකි භාණ්ඩ අර්ධ පොදු භාණ්ඩ ලෙස හැඳින්වේ.

නිදසුන් - අධිවේගී මාර්ග, කෞතුකාගාර , මුහුදු වෙරළ, සංගීත සංදර්ශන, ක්‍රීඩා පිට්ටනි, පොදු උද්‍යාන

පාරිභෝජනයේ තරඟකාරිත්වයක් දැකිය හැකි පාරිභෝජනය සීමා කළ නොහැකි සම්පත් පොදු සම්පත් ලෙස හැඳින්වේ.

නිදසුන් - තෘණ බිම්, සාගර මසුන් , මිරිදිය (පොදු) ජලාශ වල මසුන්

(ii) බදු අය කිරීම සඳහා විෂය වන නැතහොත් මූලාශ්‍ර වන දෑ බදු පදනම වශයෙන් හැඳින්වේ.


බදු පදනමේ මූලාශ්‍ර ලෙස

ආදායම
දේපොළ
පිරිවැටුම
නිමැවුම

ආනයන හා අපනයන දැක්විය හැක.

(iii) නිෂ්පාදනයේ ධන බාහිරතා පවතින විට ආන්තික පෞද්ගලික පිරිවැය ආන්තික සමාජයීය පිරිවැය ඉක්මවා යයි. එවිට සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම මට්ටම වෙළෙඳපොළ මගින් ලබා දෙන නිෂ්පාදන මට්ටමට වඩා වැඩිවේ.


නිෂ්පාදනයේ ධන බාහිරතා පවතින තත්වය රූප සටහනකින් මෙසේ දැක්විය හැකිය.



මෙම ප්‍රස්තාර සටහන නිරූපනය කරන ආකාරයට නිෂ්පාදනයේ ධන බාහිරතා පවතින අවස්ථාවේදී සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම වන Qs වෙළෙඳපොල සමතුලිත නිමැවුම් මට්ටම වන Qp ට වඩා වැඩි වන අතර සමාජයට අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවෙන් වෙළෙඳපොල සැපයුම පවතී.

නිෂ්පාදනයේ සෘණ බාහිරතාවන් පවත්නා විට ආන්තික සමාජ පිරිවැය, ආන්තික පෞද්ගලික පිරිවැය ඉක්මවා යයි. එවිට නිදහස් වෙළෙඳපොල තුලින් ලබා දෙනු ලබන සමතුලිත නිමැවුම සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුමට වඩා වැඩිවේ.

නිෂ්පාදනයේ සෘණ බාහිරතා පවතින තත්වය රූප සටහනකින් මෙසේ දැක්විය හැකිය.




ප්‍රස්තාර සටහනට අනුව වෙළෙඳපොල සැපයුම් ප්‍රමාණය Qp වන අතර සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම Qsවේ. එහෙයින් නිෂ්පාදන සෘණ බාහිරතාවයක් පවත්නා අවස්ථාවේදී සමාජයට අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා වැඩි නිෂ්පාදනයක් සිදුවේ.

(iv) ආර්ථිකයේ බදු බර විවිධ කොටස් ( පාරිභෝගිකයා හා නිෂ්පාදකයා) අතර බෙදී යන ආකාරය ආපාතය ලෙස හඳුන්වයි.

බදු ආපාතය කොටස් දෙකකි.

- ව්‍යවස්ථාපිත බදු ආපාතය
- ආර්ථික බදු ආපාතය

ව්‍යවස්ථාපිත බදු ආපාතය යනු බද්දට නෛතික වශයෙන් යටත් වන්නේ කවුරුන්ද යන්නයි.

ආර්ථික බදු ආපාතය යනු රජය පනවනු ලබන බද්ද අවසන් වශයෙන් දරන්නේ කවුරුන්ද යන්නයි. එනම් බද්ද නිසා ආර්ථිකයට දරන්නට වන පිරිවැයයි.

(v) ශුද්ධ මූල්‍ය හිඟය යන්නෙන් අදහස් කරනුයේ වර්තන වියදම් හා රාජ්‍ය ණය ආපසු ගෙවීම් ඇතුළත් නොවූ ප්‍රාග්ධන වියදම්වල එකතුවත් ප්‍රධාන ලැබීම් සහිත රජයේ මුළු ආදායමත් අතර වෙනසයි.
අයවැය ලේඛණයේ සමස්ථ ශේෂයෙන් ණය ආපසු ගෙවීම් අඩු කල පසු ශුද්ධ මූල්‍ය හිඟය ලැබේ.

ශුද්ධ මූල්‍ය හිඟය = සමස්ත ශේෂය + ණය ආපසු ගෙවීම

ශුද්ධ මූල්‍ය හිඟය = ප්‍රදාන ලැබීම් සහිත රජයේ මුළු ආදායම - (වර්තන වියදම් +ණය ආපසු ගෙවීම් රහිත ප්‍රාග්ධන වියදම)

2.

(i)

a) වර්තන ගිණුමේ ශේෂය

මුළු ආදායම = බදු ආදායම + බදු නොවන ආදායම
= 15,000 + 10,000
= 25,000

වර්තන ගිණුමේ ශේෂය = මුළු ආදායම - පුනරාවර්තන වියදම්
= 25,000 – 19,000
= 6,000

b) සමස්ත ගිණුමේ ශේෂය=මුළු අයභාරය(ප්‍රධාන ලැබීම් ඇතුළුව) - ආණ්ඩුවේ මුළු වියදම
28000-29000
-1000

වියදම් හා ආපසු ගෙවීම් අඩු කල පසු ණය දීම්= පුනරාවර්තන වියදම් +ප්‍රාග්ධන ශුද්ධ ණය දීම්
= 19,000 + 10,000
= 29,000

c) ප්‍රාථමික ගිණුමේ ශේෂය = සමස්ත ගිණුමේ ශේෂය + පොළී ගෙවීම්
= -1000 + 4000
= 3000

(ii) - පොදු භාණ්ඩ සම්පාදනය නොවීම.
-සුභ සාධන භාණ්ඩ ඌණ නිෂ්පාදනය වීම.
-අවගුණ භාණ්ඩ අධි නිෂ්පාදනයක් සිදු වීම.
-පොදු සම්පත් උපයෝජනය අකාර්යක්ෂම වීම.
-ඒකාධිකාරී තත්වයන් ගොඩනැඟීම.
-සාධක අසංචලතාව.
-බාහිරතා හට ගැනීම.

(iii) බදු ආදායමේ සංවේදිතා සංගුණකය යනුවෙන් අදහස් කරන්නේ දල දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව බදු ආදායම කොතෙක් දුරට වර්ධනය වී තිබේද මිනුම් කිරීමයි.

$$\text{බදු ආදායමේ සංවේදිතා සංගුණකය} = \frac{\text{බදු ආදායම වෙනස් වීමේ ප්‍රතිශතය}}{\text{දල දේශීය නිෂ්පාදනය වෙනස් වීමේ ප්‍රතිශතය}}$$

(iv) සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්ති යනු සූක්ෂම ආර්ථික විද්‍යාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වන අතර ඒවා මඟින් අපේක්ෂා කරනුයේ වෙළෙඳපොළ ආර්ථිකයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් ආර්ථික වෘද්ධිය වේගවත් කිරීමයි.

සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්ති වල උපකරණ කිහිපයකි.

- බදු ප්‍රතිසංස්කරණ
- පෞද්ගලීකරණය
- ශ්‍රම වෙළෙඳපොල ප්‍රතිසංස්කරණ
- ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ
- නියාමනහරණය

(v) - ආදායම් බදු
-එකතු කළ අගය මත බදු (VAT)
-නිෂ්පාදන බදු / සුරා බදු
- ආනයන මත බදු
- අනෙකුත් බදු

3.

(i) ස්වයංක්‍රීය ස්ථායිකරණ ප්‍රතිපත්ති

ආදායම ඉහළ යන විට කුටුම්භ හා ව්‍යාපාරික ආයතන ගෙවනු ලබන බදු අයභාරය ඉහළ ගොස් ආදායම ඉහළ යාමෙන් සමස්ත ඉල්ලුම මත ඇති කරන ප්‍රසාරණාත්මක බලපෑම, බදු ආදායම ඉහළ යාම මඟින් ස්වයංක්‍රීයව පාලනය වීම ස්වයංක්‍රීය ස්ථායිකරණ ප්‍රතිපත්තියවේ.

අභිමථානුසාරී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති

අභිමථානුසාරී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති යන්නෙන් අදහස් කරනුයේ ආණ්ඩුවේ වියදම් සහ බදු ස්වයංක්‍රීයව වෙනස් වීමට ඉඩ නොදී සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් අවශ්‍ය පරිදි ආණ්ඩුවේ වියදම් හා බදු වෙනස්කම් ඇති කිරීමය.

(ii) පොලිස් සේවය - අර්ධ පොදු භාණ්ඩ
ගෝලීය මූල්‍ය ස්ථාවරත්වය-ගෝලීය පොදු භාණ්ඩ
ජාතික ආරක්ෂාව -පොදු භාණ්ඩ
තණ බිම් -පොදු සම්පත්

(iii) විශ්‍රාම වැටුප්,රණවිරු දීමනා, මහපොළ ශිෂ්‍යාධාර, පාසල් නිලඇඳුම්,
පොහොර සහනාධාර,වැඩිහිටි දීමනා
සමෘද්ධි
පාසල් පෙළපොත්

(iv) -ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයේ දක්නට ලැබෙන දෘඪතාවන්
-ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල අවිදූර දෘෂ්ටිකත්වය
-අසම්පූර්ණ තොරතුරු මත ප්‍රතිපත්ති කරා එළඹීම.
-සානුබල කෙරෙහි අහිතකර ලෙස බලපෑම.
-ආණ්ඩුවේ මැදිහත් වීම් වලින් වැළකී සිටීමට කටයුතු කිරීම.
-පරිපාලන වියදම් ඉහළ යාම.

(v) - බදුකුලී ආදායම
-පොලී ආදායම
-ලාභ ,ලාභාංශ ආදායම්
-කුලී ආදායම්
-සමාජ සංරක්ෂණ දායක මුදල්
-දඩ අයකිරීම්
-ගාස්තු හා අලෙවි ආදායම්

4.

(i) ගිග් ආර්ථිකය යනුවෙන් අදහස් කරනුයේ සේවා යෝජකයා සහ සේවා දායකයා අතර සම්ප්‍රදායික සේවා පැවැත්මට වෙනස්ව ශ්‍රම වෙළෙඳපොලේ නිදහස් ශ්‍රමිකයන් හෝ නාමික කොන්ත්‍රාත්කරුවන් සිටින ආර්ථිකයකි.
ගිග් ආර්ථිකය, අන්තර්ජාලය වේදිකා ආර්ථිකය, හවුල් ආර්ථිකය හෝ ඉල්ලුම පදනම් කරගත් ආර්ථිකය ලෙස ද හැඳින්වේ.

ගිග් ආර්ථික කටයුතු වල නිරතවීමට හේතු ලෙස
- තමන් කැමති වෙලාවක වැඩ කිරීමට හැකි වීම.
- රැකියාව සහ පෞද්ගලික ජීවිතය සමතුලිතව පවත්වා ගැනීමට පහසු වීම.
- අතිරේක ආදායම් මාර්ගයක් ලෙස යොදා ගත හැකි වීම.

(ii) පෞද්ගලික දෘෂ්ටිකෝණයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය තීරණය වන විට පැවතිය හැකි ලක්ෂණ වන්නේ පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ පෞද්ගලික ආන්තික පිරිවැයට සමාන වීමයි.

පෞද්ගලික දෘෂ්ටිකෝණයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය } පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ = පෞද්ගලික ආන්තික පිරිවැය

සමාජීය දෘෂ්ටිකෝණයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය } සමාජයීය ආන්තික ප්‍රතිලාභ = සමාජ ආන්තික පිරිවැය

(iii) භාණ්ඩ හා සේවා පරිභෝජනය හේතුවෙන් ධන බාහිරතා විශාල වශයෙන් ඇති කරන භාණ්ඩ සුගුණ භාණ්ඩ (ශුභ සාධන) ලෙස හැඳින්වේ. මේවා මිලක් නොගෙවන අය පරිභෝජනයෙන් බැහැර කළ හැකිය.
සුගුණ භාණ්ඩ වලට නිදසුන් - බෝවන රෝග වැළැක්වීමට දෙන එන්නත්, අධ්‍යාපනය සේවා, සෞඛ්‍ය සේවා

භාණ්ඩයක
හෝ සේවාවක හෝ පරිභෝජනය හේතුවෙන් සෘණ බාහිරතා ඇති කරන භාණ්ඩ අවගුණ භාණ්ඩ ලෙස හැඳින්වේ.
අවගුණ භාණ්ඩවල පෞද්ගලික ප්‍රතිලාභ සමාජ ප්‍රතිලාභ වලට වඩා වැඩිවේ.
අවගුණ භාණ්ඩවලට නිදසුන් - මත්පැන් , දුම්වැටි
සුභ සාධන භාණ්ඩ වලට ප්‍රතිවිරුද්ධ ස්වරූපය අවගුණ භාණ්ඩවේ.
කෙනෙකු අවගුණ භාණ්ඩ පරිභෝජනය හේතුවෙන් සමාජයේ සෙසු පාර්ශවයන්ට සෘණ බාහිරතා ඇති කරයි.

(iv) කුටුම්භ අංශ වෙත පැවරුම්
පොලී ගෙවීම්
වැටුප් හා වේතන
අනෙකුත් භාණ්ඩ හා සේවා
රාජ්‍ය ආයතන හා සංස්ථා වෙත පැවරුම්

(v) <u>ණය උපකරණ අනුව</u>
භාණ්ඩාගාර බැඳුම්කර
භාණ්ඩාගාර බිල්පත්
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර
මහ බැංකු තාවකාලික අත්තිකාරම්
<u>ආයතන අනුව</u>
බැංකු
බැංකුනොවන

5.

(i)

- පොදු භාණ්ඩ නොසැපයීම.
- අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ථව පරිභෝජනය නොවීම
- ශුභසාධන භාණ්ඩ ප්‍රශස්ථව නොසැපයීම.
- සමාජයට අහිතකර භාණ්ඩ සැපයීම.
- පොදු සම්පත් අධිභාවිතය.
- බාහිරතා සැලකිල්ලට නොගැනීම.
- අපූර්ණ තරගය හා ඒකාධිකාරත්වය
- අපූර්ණ තොරතුරු

(ii) බාහිරතා යනු කිසියම් නිෂ්පාදන හෝ පරිභෝජන ක්‍රියාවලියක් නිසා වෙනත් පාර්ශවයක් මත ඇති කරන නිෂ්පාදන හේ පරිභෝජන ක්‍රියාවට ඍජුව සම්බන්ධ අය විසින් සැලකිල්ලට නොගන්නා ප්‍රතිලාභ හෝ පිරිවැයයි.

බාහිර ප්‍රභේද
නිෂ්පාදනයේ ඍණ බාහිරතා
නිෂ්පාදනයේ ධන බාහිරතා
පරිභෝජනයේ ඍණ බාහිරතා
පරිභෝජනයේ ධන බාහිරතා

(iii)

a. පෞද්ගලික පිරිවැය යනු කිසියම් නිෂ්පාදනයක් හෝ පරිභෝජන කටයුත්තක් වෙනුවෙන් ඒ සඳහා ඍජුවම සම්බන්ධවන පාර්ශවය හෝ පුද්ගලයා දරණ පිරිවැයයි.
b. බාහිර පිරිවැය යන්නෙන් අදහස් වන්නේ කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් හෝ පරිභෝජන ක්‍රියාවලියක් හෝ බාහිර පාර්ශවයන්ට දැරීමට සිදුවන පිරිවැයයි.

c. බාහිර ප්‍රතිලාභ යනු කිසියම් නිෂ්පාදන ක්‍රියාවක් හෝ පරිභෝජන ක්‍රියාවලියක් නිසා බාහිර පාර්ශවයන්ට ලැබෙන ප්‍රතිලාභයක් වන අතර ඒ වෙනුවෙන් ගෙවීමක් නොකරයි.

d. කිසියම් නිෂ්පාදන හෝ පරිභෝජන ක්‍රියාවක් නිසා එයට ඍජුව සම්බන්ධ පුද්ගලයා හෝ පාර්ශවය දරණ පිරිවැය හා බාහිර පාර්ශව දරණ පිරිවැයෙහි එකතුව සමාජ පිරිවැයයි.

සමාජ පිරිවැය = පෞද්ගලික පිරිවැය + බාහිර පිරිවැය

(iv)

- සාර්ව ආර්ථික ස්ථායීතාව ඇති කිරීම.
- ශ්‍රම වෙළෙඳපොළ දෘඪතාවන් ඉවත් කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම.
- දේශපාලන ස්ථාවරත්වය ඇති කිරීම.
- යහපාලනය ශක්තිමත් කිරීම.
- යටිතල පහසුකම් දියුණු කිරීම.
- බදු ප්‍රතිසංස්කරණ .

(v)

2020/2021 වසර වලදී

| | 2020 | 2021 | | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| බදු ආදායම | 89% | 89.1% | බදු නොවන ආදායම | 11% | 10.9% |
| ආනයන මත බදු | 8% | 4.4 % | ලාභ හා ලාභාංශ | 1% | 2.1% |
| එකතු කළ අගය මත බදු | 17% | 21.2% | කුලී හා පොළී ආදායම | 1% | 0.8% |
| අනෙකුත් බදු | 20% | 21.7% | ගාස්තු හා අය කිරීම | 4% | 2.9% |
| ආදායම් බදු | 20% | 20.7% | අනෙකුත් | 5% | 5.1% |
| නිෂ්පාදන බදු | 24% | 21.1% | | | |

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

**www.ALNoteBook.com**

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."